# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/49 – 2011 ජනවාරි 08 වැනි සෙනසුරාදා – 2011.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, කෙන්ගල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/කේඑන්ඩී/2008/176 හා 2009 දෙසැම්බර් මස 24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0268ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි 'කොලොන්ගහවත්ත' නමැති ඉඩම් කොටසට:

01. **කැබලි අක්ෂර 'ඒ' – කොලොන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0268ක් පමණ**

උතුරට: මු.පි.මහ 2681 හි කැබලි අංක 12 සහ මු.පි.මහ 5724 හි කැබලි අංක 1; නැගෙනහිරට: මු.පි.මහ 5724 හි කැබලි අංක 1 සහ මු.පි.මහ 2681 හි කැබලි අංක 12; දකුණට: මු.පි.මහ 2681 හි කැබලි අංක 12 සහ 20; බටහිරට: මු.පි.මහ 2681 හි කැබලි අංක 20 සහ 12.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2007/ඩබ්එස්/349.
2010 නොවැම්බර් මස 18 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 - 467